## සංක්ෂේපය

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අ.පො.ස. (සා.පෙ.) විභාගය වසර දහනුනක පාසල් අධ්‍යාපනය අවසානයේදී සිසුන් ගේ සාධනය මැනීම සඳහා පවත්වනු ලබන සාධන පරීක්ෂණයකි. එහෙත් විශ්ව විද්‍යාල, අනුබද්ධ විශ්ව විද්‍යාල, අධ්‍යාපන විද්‍යා පීඨ වැනි උසස් අධ්‍යාපන ආයතන වලට පමණක් නොව විවිධ රැකියා සඳහා සුදුස්සන් තේරීමේදී ද තේරීම් පරීක්ෂණයක් වශයෙන් මෙම විභාගය භාවිතයට ගැනේ. ජාතික මට්ටමින් පිළිගත් සහතිකයක් ලබාදීම සඳහා පවත්වනු ලබන සාධන පරීක්ෂණයක් වශයෙන් මෙම විභාගය කොතරම් දුරට සාර්ථකවේ ද යන්නත්, මෙම විභාගයේ ප්‍රතිඵල තේරීම් කාර්යයන් සඳහා යොදා ගැනීම කොතරම් සාධාරණ ද යන්නත්, තේරීම් පරීක්ෂණයක් වශයෙන් මෙම විභාගය යොදා ගැනීම විභාගයේ ගුණාත්මක භාවය කෙරෙහි කෙසේ බලපාන්නේද යන්නත්, අධ්‍යයනය කර, එහිදී ඇතිවන ඌනතා හඳුනා ගැනීමත්, එම ඌනතා වලට සුදුසු පිළියම් යෝජනා කිරීමත් මෙම අධ්‍යයනයේ අරමුණ විය.

සාධන පරීක්ෂණයක සාර්ථකත්වය සඳහා තිබිය යුතු වලංගුතාව හා විශ්වසනීයතාව රැක ගැනීම සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරන ක්‍රියා මාර්ග පිළිබඳවත්, සහතික කරණයේදී සහ තේරීමේදී වැදගත් වන අංගයන් වන විවිධ විෂයයන්ගේ ප්‍රශ්න පත්‍ර අතර සහ පොදු විෂය ක්ෂේත්‍රවල ප්‍රශ්න පත්‍ර අතර, දුෂ්කරතා වල සමානත්වය පිළිබඳවද, විභවනතාවය පිළිබඳවද මෙම අධ්‍යයනයේදී අවධානය යොමු කරන ලදී. පිළිතුරු පත් ලකුණු කිරීමේදී විවිධ විෂයයන් අතර මෙන්ම මාධ්‍ය වශයෙන් ද ඇති ඌනතා හඳුනා ගැනීම සඳහා ප්‍රධාන විෂයයන්ගේ ලකුණු ප්‍රමිත කර නිරීක්ෂණය කරන ලදී.

ඒ අනුව සාධන පරීක්ෂණයක් වශයෙන් ප්‍රශ්න පත්‍රවල වලංගුතාව හා විශ්වසනීයතාව රැක ගැනීම සඳහා යොදා ගන්නා උපාය මාර්ග වලින් ඉතා සාර්ථක ප්‍රතිඵල ලබාගෙන ඇති බවත්, ඒ නිසා ප්‍රශ්න පත්‍ර වල ගුණාත්මක බව ඉහළ මට්ටමක පවතින බවත්, නිගමනය කළහැක.

OPEN UNIVERSITY LIBRARY

මෙම අධ්‍යයනයේදී පහත සඳහන් ඌනතාවන් හඳුනා ගන්නා ලදී.

1. ප්‍රශ්න පත්‍ර සකස් කරන මණ්ඩල වල සාමාජිකයින් වැඩි දෙනෙකුට අධ්‍යාපනික මිණුම් සහ ඇගයීම් ක්‍රම පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් නොතිබීම.

2. ප්‍රශ්න පත්‍ර සකස් කරන්නන්ට පංති කාමරය තුළ විෂය මාලාව ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව අවබෝධයක් හා අත්දැකීම් නොතිබීම.

3. ප්‍රශ්න පත්‍රය ප්‍රධාන වශයෙන් ප්‍රජානන ක්ෂෙත්‍රයේ දක්ෂතා මැනීම සඳහා යොමු වන අතර මනෝ චාලක හා වින්දන ක්ෂෙත්‍රයන්ගේ දක්ෂතා මැනීම සඳහා අවස්ථා විරල වීම.

4. තේරීම් කාර්යය පහසු කිරීමේ අපේක්ෂාවෙන් ප්‍රශ්න පත්‍ර වල දුෂ්කරතාව වැඩි කිරීම නිසා වැඩි අපේක්ෂක සංඛ්‍යාවක් අසමත්වීම.

5. සමහර විෂයයන්ගේ ප්‍රශ්න පත්‍රවල දුෂ්කරතාව දුතා අඩුවීම නිසා අනෙකුත් සිසුන්ට අවාසි සිදුවීම.

6. උත්තර පත්‍ර ලකුණු කිරීමේදී විෂය අතර මෙන්ම මාධ්‍ය වශයෙන් ද විචලතා තිබීම.

මෙම ඌනතාවන් මග හරවා ගැනීම සඳහා සුදුසු පිළිවෙත් වශයෙන්, පංති කාමරයේ උගන්වන ගුරුවරුන් අතරින් සුදුසු අය තෝරා ගෙන ඔවුනට අවශ්‍ය පුහුණුව දී ඔවුන් විසින් සකස් කරන ලද පූර්ව පරීක්ෂණ වලට භාජනය කරන ලද ප්‍රශ්න ඇතුලත් ප්‍රශ්න බැංකුවක් පිහිටුවීමත්, උසස් අධ්‍යාපන ආයතන වලට හා රැකියා වලට තේරීමේදී උසස් පෙළ විභාගයට අමතර වශයෙන් අභියෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීමත්, තේරීම් කාර්යයට යොදා ගැනීමේදී උසස් පෙළ විභාගයේ දළ ලකුණු ප්‍රමිත කිරීමත් යෝජනා කෙරේ.